# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1993 අංක 49 දරන වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1993 ඔක්තෝබර් මස 22 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 7, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය.

මිල : රු. 5.10 ශ.　　　　තැපැල් ගාස්තුව : රු. 3.10 ශ.

# 1993 අංක 49 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 20 දින]

**එල්. ඩී.—ඕ. 91/90**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1993 අංක 49 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ දීර්ඝ නාමය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කරනු ලැබේ :— 69 වන අධිකාරයේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම.

> " ශ්‍රී ලංකාවේ වන සත්ව හා වෘක්ෂලතා සංරක්ෂණය කිරීම සහ පරික්ෂණය කිරීම ; එම වන සත්වයින් හා වෘක්ෂලතා වාණිජ වශයෙන් ප්‍රයෝජනයට ගැනීම වැළැක්වීම සඳහා විධිවිධාන සැලැස්වීම ; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි. ".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

" (ඉ) ආරක්ෂා ස්ථානයක් ; හෝ

(ඊ) සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශයක් ; හෝ

(උ) සීමාන්තරික කලාපයක්. ".

(2) එම වගන්තියේ (4) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අ) දැඩි ස්වභාව රක්ෂිතයක, ජාතික වනෝද්‍යානයක, ස්වභාව රක්ෂිත භූමියක, වන පිවිසුමක, ආරක්ෂා ස්ථානයක, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශයක හෝ සීමාන්තරික කලාපයක සීමා නැවත සකස් කරන බව හෝ වෙනස් කරන බව ; ".

(3) එම වගන්තියේ පාර්ශ්ව සටහනේ " අන්තර් කලාප හා අභය භූමි " යන වචන වෙනුවට " ආරක්ෂා ස්ථාන, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශ, සීමාන්තරික කලාප සහ අභය භූමි " යන වචන ආදේශ කිරීමෙන්.

2—ඩී 026126—8,180 (93/01)

ප්‍රධාන ප්‍රඥප්තියෙහි අලුත් 2අ වගන්තිය ඇතුලත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 2අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ජාතික රක්ෂිත භූමි ඇතුළත පහසුකම් පාලනය හා කළමනාකරණය.

2අ. යම් ජාතික රක්ෂිත භූමියක් ඇතුළත සැල සිය යුතු පහසුකම් හා සේවා, අධ්‍යක්ෂවරයා විසින් පරිපාලනය, පාලනය හා කළමනාකරණය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) යම් දැඩි ස්වභාව රක්ෂිතයකට හෝ ස්වභාව රක්ෂිත භූමියකට, ඇතුළුවීමට හෝ එහි වූ වෘක්ෂලතා වලට හානි කිරීමට කිසිම තැනැත්තකුට නිමිකම් නැත්තේ ය ;

(ආ) දැඩි ස්වභාව රක්ෂිතයක දී, ජාතික උද්‍යානයක දී හෝ ස්වභාව රක්ෂිත භූමියක දී, කිසිම සතකු දඩයම් කිරීම, මැරීම හෝ ගැනීම හා කිසිම පැළෑටිය කට හානි කිරීම, පැළෑටියක් උගුල්ලා ගැනීම හෝ විනාශ කිරීම නොකළ යුතු ය.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්,

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් ස්වභාව රක්ෂිත භූමියක" යන වචනවල සිට "පිහිටුවීමේ දිනයට" යන වචන දක්වා ඇති සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "යම් ස්වභාව රක්ෂිත භූමියක සීමා ඇතුළත පිහිටි ඉඩමක් තුළ හෝ ඉඩමක් මත හෝ යම් අභය භූමියක් තුළ වූ රජයේ ඉඩමක හෝ ඉඩමක් මත ක්‍රියාත්මක කිරීමට නීතිය හෝ චාරිත්‍රය හෝ ව්‍යවහාරය අනුව අත්කරගෙන ඇත්තාවූත් ඒ රක්ෂිත භූමිය, පිහිටුවීමේ දිනයට" යන වචන ආදේශ කිරීමෙන්.

(4) එම වගන්තියේ පාර්ශ්ව සටහනේ "වන පිවිසුම, ජාතික උද්‍යාන, අභය භූමි සහ අන්තර් කලාප" යන වචන වෙනුවට "ජාතික උද්‍යාන සහ අභය භූමි" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 3අ වගන්තිය ඇතුළත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 3අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"ජාතික රක්ෂිත භූමියක සිට සැතපුමක් ඇතුළත සංචාරක හෝටල් යනාදිය තහනම් කිරීම.

3අ. ජාතික රක්ෂිත භූමියක මායිමෙන් සැතපුම් එකක් ඇතුළත කිසිම තැනැත්තකු විසින් සංචාරක හෝටලයක් ඉදිකිරීම හෝ සංචාරක හෝටලයක් විසින් සපයනු ලබන සේවා හෝ පහසුකම්වලට සමාන යම් සේවා හෝ පහසුකම් සැපයීම නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ස්වභාව රක්ෂිත භූමිවලට, ඇතුළුවීම සීමා කිරීම.

5අ. (1) නියමිත ගාස්තුව ගෙවූ විට නියමිත නිලධරයා විසින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක බලය යටතේ හා එකී අවසර පත්‍රයේ කොන්දේසි අනුව විනා, කිසිම තැනැත්තකු විසින්, යම් ස්වභාව රක්ෂිත භූමියකට ඇතුළුවීම හෝ ඒ තුළ රැඳී සිටීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අවසර පත්‍රයක් නිකුත් කිරීම සඳහා කිසිම ගාස්තුවක් නියම කර නොමැති නම්, ඒ අවසර පත්‍රය ගාස්තු අය කිරීමකින් තොරව නිකුත් කරනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(i) "ස්වභාව රක්ෂිත භූමියක් හෝ වන පිවිසුමක්" යන වචන වෙනුවට "ස්වභාව රක්ෂිත භූමියක්, වන පිවිසුමක්, ආරක්ෂා ස්ථානයක්, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශයක් හෝ සීමාන්තරික කලාපයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (උ) ඡේදය අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(උ) යම් සතෙකුට හෝ පැලෑටියකට හානි කිරීමේ හෝ සතකු හෝ පැලෑටියක් විනාශ කිරීමේ කාර්යය සඳහා පාවිච්චි කිරීමේ හැකියාවක් ඇති යම් උගුලක් හෝ යම් පුපුරන ද්‍රව්‍යයක් හෝ තුවක්කුවක් හෝ වෙනත් ආයුධයක් හෝ වස ද්‍රව්‍යයක් සන්තකයෙහි තබාගැනීම හෝ පාවිච්චි කිරීම;".

(iii) එම උපවගන්තියේ (ඒ) ඡේදයේ "අඩි පාරක් පාවිච්චි කිරීම" යන වචන වෙනුවට "අඩි පාරක් පාවිච්චි කිරීම ; හෝ "යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iv) එම උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඔ) යම් සංචාරක හෝටලයක් ඉදිකිරීම හෝ පාලනය කිරීම හෝ සංචාරක හෝටලයක් මගින් සපයනු ලබන සේවාවලට හෝ පහසුකම්වලට සමාන යම් සේවා හෝ පහසුකම් සැපයීම.".

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියේ "ස්වභාව රක්ෂිත භූමියක් හෝ වන පිවිසුමක්" යන වචන වෙනුවට "ස්වභාව රක්ෂිත භූමියක්, වන පිවිසුමක්, ආරක්ෂා ස්ථානයක්, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශයක් හෝ සීමාන්තරික කලාපයක්" යන වචන ආදේශ කිරීමෙන්.

(3) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(4) මේ වගන්තියේ විධිවිධානවලින් යමක් උල්ලංඝනය කරමින් ක්‍රියා කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමේ දී එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට යටත් වන්නේ ය.".

(4) එම වගන්තියේ පාර්ශ්ව සටහනේ "ස්වභාව රක්ෂිත භූමිවලට හා වන පිවිසුම්වලට" යන වචන වෙනුවට "ස්වභාව රක්ෂිත භූමිවලට, වන පිවිසුම්වලට, ආරක්ෂා ස්ථානවලට, සමුද්‍රීය රක්ෂිත ප්‍රදේශවලට හෝ සීමාන්තරික කලාපවලට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ—

(i) (අ) ඡේදය අත්හැරීමෙන් ;

(ii) (ආ) ඡේදයෙහි "යම් අන්තර් කලාපයක් හෝ අභය භූමියක් තුළ" යන වචන වෙනුවට "යම් අභය භූමියක් තුළ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(iii) (ඇ) ඡේදයෙහි "යම් අන්තර් කලාපයක් තුළ හෝ අභය භූමියක් ඇතුළත වූ රජයේ ඉඩමක්" යන වචන වෙනුවට "යම් රජයේ ඉඩමක" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එම වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

(3) එම වගන්තියේ පාර්ශ්ව සටහනෙහි "අන්තර් කලාප තුළ හා අභය භූමි තුළ" යන වචන වෙනුවට "අභය භූමි තුළ" යන වචන ආදේශ කිරීමෙන්.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ජාතික රක්ෂිත භූමියක් අසල සංසරණ ක්‍රියා.

8. දැඩි ස්වභාව රක්ෂිතයකින්, ජාතික උද්‍යානයකින්, ස්වභාව රක්ෂිත භූමියකින්, වන පිවිසුමකින් ආරක්ෂා ස්ථානයකින්, සමුද්‍රිය රක්ෂිත ප්‍රදේශයකින් හෝ සීමාන්තරික කලාපයකින් පිටත යම් මාර්ගයක හෝ ඉඩමක සිට එවැනි දැඩි ස්වභාව රක්ෂිතයක, ජාතික උද්‍යානයක, ස්වභාව රක්ෂිත භූමියක, වන පිවිසුමක, ආරක්ෂා ස්ථානයක, සමුද්‍රිය රක්ෂිත ප්‍රදේශයක හෝ සීමාන්තරික කලාපයක සිටින කිසිම වන සතෙකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මැරීම හෝ ගැනීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 8අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 8අ වගන්තිය ඇතුළත් කිරීම.

"ස්වභාවික මාර්ග.

8අ. (1) අධ්‍යක්ෂවරයා විසින් ජාතික රක්ෂිත භූමියක් තුළ ඇති මාර්ග සහ අඩි පාරවල් එම ජාතික රක්ෂිත භූමිය තුළ ඇති සතුන් සහ වෘක්ෂලතා අධ්‍යයනය කිරීමට හෝ නිරීක්ෂණය කිරීමට, පයින් ගමන් කිරීමට කැමති යම් තැනැත්තකුගේ ප්‍රයෝජනය සඳහා වූ ස්වභාවික මාර්ග ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය :

එසේ වුවද එම ස්වභාවික මාර්ග පාවිච්චි කරන යම් තැනැත්තකුට සිදු විය හැකි යම් තුවාල සිදු වීමක් හෝ අලාභයක් සම්බන්ධයෙන් රජය වග කිව යුතු නොවේ.

(2) නියමිත ගාස්තුව ගෙවූ පසු අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරනු ලබන අවසර පත්‍රයක් ලබා ගෙන ඇතොත් මිස කිසිම තැනැත්තකු එවැනි ස්වභාවික මාර්ගයක් පාවිච්චි නොකළ යුතු ය.

(3) එවැනි ස්වභාවික මාර්ගයක් යම් තැනැත්තකු විසින් පාවිච්චි කළ හැකි ආකාරය නිශ්චිතව සඳහන් කෙරෙන නියෝග සාදනු ලැබිය හැකි ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) (අ) ඡේදය අත්හැරීමෙන් ; සහ

(2) (ඇ) ඡේදයෙහි "යම් අන්තර් කලාපයකට හෝ අභය භූමියකට" යන වචන වෙනුවට "අභය භූමියකට" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 9අ වගන්තිය ඇතුළත් කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 9අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ජාතික රක්ෂිත භූමිවලින් සැතපුම් එකක් ඇතුළත, සංවර්ධන ක්‍රියාකාරකම් සීමා කිරීම.

9අ. (1) 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මගින් ප්‍රකාශයට පත් කරන ලද යම් ජාතික රක්ෂිත භූමියක මායිමේ සිට සැතපුම් එකක දුරක් ඇතුළත, පෞද්ගලික හෝ රජයේ හෝ යම් තැනැත්තකු හෝ සංවිධානයක් විසින්, අධ්‍යක්ෂවරයාගේ පූර්ව ලිඛිත අනුමතිය නොමැතිව, කවර ආකාරයක වූ හෝ යම් සංවර්ධන ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක නො කළ යුතු ය.

(2) සංවර්ධන ක්‍රියාකාරකමක් ආරම්භ කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ අනුමතිය සඳහා වූ සෑම ඉල්ලීමක් සමගම, අවස්ථාවෝචිත පරිදි එම සංවර්ධන ක්‍රියාකාරකමට අදාළවන්නා වූ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුකූලව, මූලික පාරිසරික පරීක්ෂණයක් ද පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුවක් ද ඉදිරිපත් කළ යුතු ය. එම තක්සේරුව අදාළ වන සංවර්ධන ක්‍රියාකාරකම ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දිය යුතුද නැද්ද යන්න තීරණය කිරීමේදී අධ්‍යක්ෂවරයා විසින් එම පාරිසරික බලපෑම් පිළිබඳ තක්සේරුව කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(අ) 6 වන වගන්තියේ විධිවිධාන හැර මේ ආඥාපනතේ මේ කොටසේ යම් විධිවිධානයක් :".

(2) එහි (ඇ) ඡේදයෙහි "යම් අන්තර් කලාපයක හෝ අභය භූමියකට" යන වචන වෙනුවට "යම් අභය භූමියකට" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එම වගන්තියේ "වරදක් කරන අතර" යන වචනවල සිට එම වගන්තිය අවසානය දක්වා ඇති වචන වෙනුවට "වරදක් කරන අතර වරදකරු කරනු ලැබුවිට ඒ තැනැත්තා රුපියල් දසදහසකට නොඅඩු හා රුපියල් විසිදහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් වන්නේය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" I කොටසේ අර්ථ නිරූපනය.

11. පද සම්බන්ධයෙන් අනාකාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස මේ ආඥාපනතේ මේ කොට සෙහි—

" සත්වයා " යන්නෙන් කොඳු ඇට පෙළ සහිත සත්වයකු හෝ කොඳු ඇට පෙළ රහිත සත්වයකු අදහස් වේ ;

" ගෘහාශ්‍රිත සතා " යන්නෙන්—

(අ) යම් ගවයෙක්, බැටළුවෙක්, එළුවෙක්, අශ්වයෙක්, ඌරුවෙක්, කොටළුවෙක්, බල්ලෙක් හෝ බළලෙක් ;

(ආ) කුකුළන් ඇති කිරීම වශයෙන් ඇති කරනු ලබන යම් කුකුළෙක් ;

(ඇ) මිනිසා විසින් ගෘහාශ්‍රිතව ඇති කරනු ලබන විට යම් ඌරෙක් ;

අදහස් වේ ;

" වැලුම් " යන්නෙන් ශාඛ වර්ගයේ සාමාජිකයෙකු අදහස් වේ ;

" වන සතා " යන්නෙන් ගෘහාශ්‍රිත නොවන යම් සතකු අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ II කොටසේ මාතෘකාව ප්‍රතිස්ථාපනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ II වන කොටසේ " ඇත්තු, මී හරක්, මුවෝ හා කුකුළෝ " යන මාතෘකාව වෙනුවට පහත දැක්වෙන අලුත් මාතෘකාව ආදේශ කරනු ලැබේ :—

" ඇත්තු සහ මී හරක් ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

" ජාතික රක්ෂිත භූමිවලින් හා අභය භූමිවලින් පිටත ප්‍රදේශ තුළ ඇතුන් හා මී හරකුන් ආරක්ෂා කිරීම.

12. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන පරිදි හැර, ජාතික රක්ෂිත භූමියකින් හෝ අභය භූමියකින් පිටත යම් ප්‍රදේශයක් තුළ—

(අ) යම් ඇතකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මැරීම, තුවාල කිරීම හෝ ගැනීම ; හෝ

(ආ) අධ්‍යක්ෂවරයාගෙන් ඒ වෙනුවෙන් ලබාගත් බලපත්‍රයක් නොමැතිව යම් මී හරකකු අල්ලා ගැනීම

කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම බලපත්‍රයක්ම, නියමිත ගාස්තුව ගෙවනු ලැබූ විට නියමිත ආකෘතියෙහි නිකුත් කරනු ලබන අතර මී හරකුන් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම සඳහා එහි ඇතුළු කිරීම අවශ්‍ය යයි හෝ අවස්ථානුකූල යයි අධ්‍යක්ෂවරයා සලකන යම් කාලයක් තුළ හා යම් සීමා ඇතුළත මෙන්ම, යම් කොන්දේසිවලට යටත්ව බල සහිතව පවත්නේ ය.

(3) (1) (අ) උපවගන්තිය යටතේ යම් බලපත්‍රයක් දරන්නෙකු විසින් එකී බලපත්‍රයේ කාලය අවසන් වීමෙන් පසු දින පහළොවක් ඉකුත් වීමට පෙර කාලය අවසන් වූ බලපත්‍රය අධ්‍යක්ෂවරයා වෙත හෝ නියමිත නිලධරයා වෙත ආපසු භාර දී ඔහු විසින් අල්ලා ගන්නා ලද යම් මී හරකකු පිළිබඳ විස්තර ඔහුට දැන්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) අනුඡේදයේ "නොමිලයේ හෝ නියමිත ගාස්තුව" යන වචන වෙනුවට "නියමිත ගාස්තුව" යන වචන ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ඉවත් කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ :—

"ඇතුන් හා මී හරකුන් මැරීම හෝ අල්ලා ගැනීම නොපමාව වාර්තා කළ යුතු බව.

16. 13 වන වගන්තියෙන් හෝ 14 වන වගන්තියෙන් හෝ ඒ වගන්තියක් යටතේ හෝ පවරනු ලැබූ අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමේ දී යම් ඇතකු හෝ මී හරකකු මරන හෝ අල්ලා ගන්නා යම් තැනැත්තකු විසින්, එකී මැරීම හෝ අල්ලා ගැනීම සිදු වූ ප්‍රදේශයෙහි රාජකාරි කිරීමට හිමිකම ඇති යම් පොලිස් නිලධරයකු වෙත හෝ නියමිත නිලධරයකු වෙත හෝ අධ්‍යක්ෂවරයා වෙත එකී මැරීම හෝ අල්ලා ගැනීම නොපමාව වාර්තා කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "මුවකු හෝ කුකුළකු" යන වචන යෙදෙන සෑම තැනක වුව ද එම වචන අත් හැරීමෙන්

(2) එම වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

"II වන කොටස යටතේ මරන ලද හෝ ගන්නා ලද ඇතුන් හා මීහරකුන් පිළිබඳ අයිතිය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 19අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ අලුත් 19අ වගන්තිය ඇතුළත් කිරීම.

"ඇතකුගේ යම් කොටසක් අපනයනය කිරීම තහනම් කිරීම.

19අ.(1) 40 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද කිසිම තැනැත්තකු විසින්—

(අ) යම් ඇත් දළයක් හෝ ඇත් දතක් හෝ ඇත් දළයක හෝ ඇත් දතක යම් කොටසක් හෝ ඇත් දළයකින් හෝ ඇත් දතකින් තැනහොත් ඇත් දළයක හෝ ඇත් දතක කොටසකින් සෑදූ යම් භාණ්ඩයක් හෝ ඇත් දළයකින් හෝ ඇත් දතකින් ලබාගත් ඇත් දත් ද්‍රව්‍ය අඩංගු යම් භාණ්ඩයක් ; හෝ

(ආ) ඇතකුගේ වෙනත් යම් කොටසක් හෝ ඇතකුගේ යම් කොටසකින් සෑදූ හෝ ඇතකුගේ යම් කොටසක් අඩංගු යම් භාණ්ඩයක්

ශ්‍රී ලංකාවෙන් අපනයනය නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට, රුපියල් තිස් දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ ඒ තැනැත්තා යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වසේ බලපැවැත්විය යුතු අතර එම ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ විය යුතු ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "වරදක් කරන අතර" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති සියලු වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

"වරදක් කරන අතර වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂ පනස් දහසකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කරනු ලැබීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේය. යම් ඇතකු මැරීම හෝ අල්ලා ගැනීම සම්බන්ධයෙන් මේ වගන්තියේ (අ) ඡේදයෙහි සඳහන් වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු සන්තකයෙහි ඒ ඇතා හෝ උගේ මළ සිරුර හෝ දළ හෝ ඇත් දත් හෝ තිබෙන බවට අධිකරණය තීරණය කළ අවස්ථාවක එකී ඇතා, මළ සිරුර, දළ හෝ ඇත් දත් රජය සඳහා සහ වෙනුවෙන් ඇරීම පිණිස ආණ්ඩුවේ යම් නිලධරයකුගේ සන්තකයට හෝ ආරක්ෂාවට භාරදෙන ලෙස විධාන කරමින් අධිකරණය විසින් ආඥා කළ හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වරදකරු කරනු ලැබූ විට" යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා ඇති සියලුම වචන වෙනුවට "වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීම හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මී හරකුන්ට අදාළ වැරදි.

22. මේ ආඥාපනතේ මේ කොටස උල්ලංඝනය කරමින් හෝ මේ ආඥාපනතේ මේ කොටස යටතේ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයක නියමයන්ට පටහැනිව යම් මීහරකකු දඩයම් කරන, වෙඩි තබන, මරණ හෝ අල්ලා ගන්නා යම් තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් දසදහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොඅඩු සහ අවුරුදු දෙකකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තිය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (7) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කිරීමෙන් :—

"(7) මේ වගන්තියෙහි විධිවිධානවලට අනුකූලව ලියාපදිංචි කරනු නොලැබූවා වූ ද බලපත්‍රයක් නොගත්තා වූ ද ඇතකු අයිතිව සිටින හෝ තම භාරයෙහි තබාගෙන සිටින හෝ එවැනි ඇතකුගෙන් ප්‍රයෝජන ගන්නා යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.".

(2) එම වගන්තියේ (8) වන උපවගන්තිය (9) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිවළ පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(8) ඇතකු තබා ගන්නා ස්ථානයක් බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට විශ්වාස කිරීමට හේතු ඇති ස්ථානයකට කවර හෝ වේලාවක ඇතුළුවීම ද මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කර ඇත් ද යන වග නිසැක ලෙසයෙන් දැන ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ හෝ විමර්ශන එහි පැවැත්වීම ද අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද නිලධරයා විසින් කළ හැකි ය.".

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "වරදක් කරන අතර" යන වචනවල සිට "යටත් වන්නේ ය" යන වචන දක්වා ඇති සියලුම වචන වෙනුවට "වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට ඒ තැනැත්තා රුපියල් එක් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් දෙලක්ෂයකට නොවැඩි දඩයකට හෝ දස අවුරුද්දකට නොඅඩු හා විසි අවුරුද්දකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය ;" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) ලියාපදිංචි නොකරන ලද ඇත් දළයක් හෝ වෙනත් ඇත් දතක් තම සන්තකයෙහි තබාගෙන සිටින යම් තැනැත්තෙක් වරදක් කරන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් විසි දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි

දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ හා 24ආ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර එය එහි 24අ සහ 24ආ වන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ඇත් දළ හා ඇත් දත් සඳහා බලපත්‍ර ලබාගත යුතු බව.

24අ. (1) ඇත් දළයක් හෝ ඇත් දතක් 24 වන වගන්තිය අනුව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසුව තමා සන්තකයෙහි ඇත් දළයක් හෝ ඇත් දතක් ඇති සෑම තැනැත්තකුම, එම ඇත් දළය හෝ ඇත් දත් සඳහා බලපත්‍රයක් ලබාගත යුතු ය.

(2) නියමිත ආකෘතියෙහි වූ ඉල්ලුම්පත්‍රයක් නියමිත නිලධරයා වෙත ඉදිරිපත් කර නියමිත ගාස්තුව ගෙවා බලපත්‍ර ලබාගත යුතු ය.

(3) සෑම නියමිත නිලධරයකු විසින් ම ඇත් දළ හා ඇත් දත් සඳහා බලපත්‍ර දීම සම්බන්ධයෙන් වූ ලේඛනයක් පවත්වා ගත යුතු ය.

(4) ඇත් දළය හෝ ඇත් දත සම්බන්ධයෙන් බලපත්‍රයක් ලබා නොගෙන එය තමා සන්තකයෙහි තබා ගන්නා සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් තිස්දහසකට නොඅඩු සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

ඇත් දළ හෝ ඇත් දත් තබා ඇති ස්ථානය පරීක්ෂා කිරීම.

24ආ. ඇත් දළ හෝ ඇත් දත් තබාගන්නා ස්ථානයක් බව විශ්වාස කිරීමට අධ්‍යක්ෂවරයාට හෝ ඔහු විසින් බලය දෙන ලද යම් නිලධරයකුට විශ්වාස කිරීමට හේතු ඇති ස්ථානයකට කවර හෝ වේලාවක ඇතුළුවීම ද මේ වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර ඇත්ද යන වග නිසැක වශයෙන් දැන ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ හෝ විමර්ශන එහි පැවැත්වීම ද අධ්‍යක්ෂවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලය දෙන ලද නිලධරයා විසින් කළ හැකි ය.".

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය ඉවත් කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ ඇති "මුවා සහ කුකුළා" යන වචනවල අර්ථ නිරූපණ පිළිවෙලින් අත් හැරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

"අලි අනාථාගාරය.

29. ඇතුන් ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා අනාථ ඇතුන් ඇති දැඩි කිරීම සහ රැක බලා ගැනීම සඳහා විධිවිධාන සලසන්නා වූ ද අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නා වූ ද අලි අනාථාගාරය හෝ සමාන ආයතන සංඛ්‍යාවක් යම් ජාතික රක්ෂිත භූමියක් හෝ අභය භූමියක් ඇතුළත හෝ ඉන් පිටත පිහිටුවනු ලැබ පවත්වාගෙන යනු ලැබිය යුතු ය.".

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ ඇති "පක්ෂීන්, මෘග සතුන් සහ උරගයෝ" යන ශීර්ෂය වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසේ ශීර්ෂය ප්‍රතියෝජනය කිරීම.

"කොඳු ඇට පෙළ සහිත සතුන් හා කොඳු ඇට පෙළ රහිත සතුන්".

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 සහ 31 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 සහ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"I වන උපලේඛනයේ ඇතුළත් නොවන ක්ෂීරපායි සතුන් සහ උරගයින් ට අදාළ වැරදි.

30. ජාතික රක්ෂිත භූමියකින් හෝ අභය භූමියකින් පිටත යම් ප්‍රදේශයක් තුළ—

(අ) I වන උපලේඛනයෙහි ඇතුළත් නොවන යම් ක්ෂීරපායි සතකු හෝ උරගයකු මරණ හෝ එම සතා හෝ උරගයාට තුවාල කරන හෝ හානි සිදු කරන හෝ එම සතා හෝ උරගයා අල්ලා ගන්නා ; හෝ

(ආ) එවැනි උරගයකුගේ බිත්තර හෝ කූඩුවක් ගන්නා හෝ විනාශ කරන ; හෝ

(ඇ) එම ක්ෂීරපායි සතා හෝ උරගයා මැරීමේ හෝ එම සතාට හෝ උරගයාට තුවාල කිරීමේ හෝ හානි සිදු කිරීමේ හෝ එම සතා හෝ උරගයා අල්ලා ගැනීමේ කාර්ය සඳහා යම් බෝට්ටුවක් හෝ යම් ලාටු වර්

ගයක් හෝ මල පුඩුවක්, දැලක්, උර් කටුවක්, උගුලක්, තුවක්කුවක්, පොල් ලක්, යම් උපකරණයක් සහිත කොක් කක් හෝ ඇමක් හෝ යම් ආකාරයක පුපුරන ද්‍රව්‍යයක් හෝ වෙනත් උපකරණ යක් පාවිච්චි කරන; හෝ

(ඇ) මරණ ලද හෝ අල්ලා ගන්නා ලද එවැනි ක්ෂීරපායී සතකු හෝ උරගයකු හෝ මරණ ලද හෝ අල්ලා ගන්නා ලද එවැනි ක්ෂීරපායී සතකුගේ හෝ උරග යකුගේ යම් කොටසක් හෝ එසේ මරණ ලද හෝ අල්ලා ගන්නා ලද ක්ෂීරපායී සතකුගේ හෝ උරගයකුගේ මස් හෝ එවැනි උරගයකුගේ බිත්තර හෝ තම සන්තකයෙහි හෝ තමාගේ පාලනය යටතේ තබාගත සිටින; හෝ

(ඈ) මරණ ලද හෝ අල්ලා ගන්නා ලද එවැනි යම් ක්ෂීරපායී සතකුගේ හෝ උරගයකු ගේ පදම් කළ හෝ නොකළ හම හෝ එම ක්ෂීරපායී සතාගේ අං හෝ අං තව් වුවක් හෝ තම සන්තකයෙහි හෝ තමා ගේ පාලනය යටතේ තබාගෙන සිටින; හෝ

(ඊ) එවැනි යම් ක්ෂීරපායී සතකු හෝ උරග යකු හෝ එම ක්ෂීරපායී සතාගේ හෝ උරගයාගේ යම් කොටසක් හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන; හෝ

(උ) පදම් කිරීමේ කාර්ය සඳහා හෝ ප්‍රයෝජන යට ගැනීමට පිළියෙල කිරීම සඳහා එම ක්ෂීරපායී සතාගේ හෝ උරගයාගේ හෝ හම මිළදී ගන්නා යම් තැනැත්තකු

වරදකට වරදකරු විය යුතු අතර එසේ වරදකරු කිරීමේදී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් තිස් දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

මේ වගන්තියේ විධිවිධාන 11 වන වගන්තිය මගින් අර්ථ නිරූපණය කරනු ලැබ ඇති යම් ගෘහාශ්‍රිත සතකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

පක්ෂීන්ට අදාළ වැරදි

31. ජාතික රක්ෂිත භූමියකින් හෝ අභය භූමියකින් පිටත යම් ප්‍රදේශයක් තුළ—

(අ) යම් පක්ෂියකු මරණ, එම පක්ෂියාට තුවාල සිදු කරන, හානි කරන හෝ එම පක්ෂියා අල්ලා ගන්නා; හෝ

(ආ) යම් පක්ෂියකුගේ බිත්තර හෝ කූඩුව ලබා ගන්නා හෝ විනාශ කරන; හෝ

(ඇ) එවැනි යම් පක්ෂියකු මැරීමේ හෝ එම පක්ෂියාට තුවාල සිදු කිරීමේ හෝ හානි සිදු කිරීමේ හෝ එම පක්ෂියා අල්ලා ගැනීමේ කාර්යය සඳහා යම් බෝට්ටුවක් හෝ යම් ලාටු වර්ගයක් හෝ මලපුඩුවක්, දැලක්, උල් කටුවක්, උගුලක්, තුවක්කුවක්, පොල්ලක් හෝ ලනුවක් හෝ යම් උපකරණ සහිත කොක්කක් හෝ ඇමක් හෝ යම් ආකාරයක පුපුරන ද්‍රව්‍යයක් හෝ වෙනත් උපකරණයක් පාවිච්චි කරන; හෝ

(ඈ) මරණ ලද හෝ අල්ලා ගන්නා ලද පක්ෂියකු. මරණ ලද හෝ අල්ලා ගන්නා ලද පක්ෂියකුගේ හමක් හෝ මරණ ලද හෝ අල්ලා ගන්නා ලද යම් පක්ෂියකුගේ පිහාටු හෝ වෙනත් යම් කොටසක් හෝ පක්ෂියකුගේ බිත්තර තම සන්තකයෙහි හෝ තම පාලනය යටතේ තබා ගෙන සිටින; හෝ

(ඉ) යම් පක්ෂියකු හෝ යම් පක්ෂියකුගේ කොටසක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන

යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේදී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය:

එසේ වුවද II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් පක්ෂියකු සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ වරදක් කරනු ලැබූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

මේ වගන්තියේ විධිවිධාන 11 වන වගන්තියෙහි අර්ථ නිරූපණය කරනු ලැබ ඇති යම් ගෘහාශ්‍රිත සතකු සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය. ”.

ප්‍රධාන ප්‍රඥප්තියට 31අ සහ 31ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති, එම ප්‍රඥප්තියේ 31අ සහ 31ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය :—

"III වන සහ IV වන උපලේඛනවල ඇතුළත් කරනු ලැබූ උභය ජීවීන්ට සහ මත්ස්‍යයන්ට අදාළ වැරදි.

31අ. ජාතික රක්ෂිත භූමියකින් හෝ අභය භූමියකින් පිටත යම් ප්‍රදේශයක් තුළ—

(අ) අනුපිළිවෙලින් III වන සහ IV වන උපලේඛනවල ඇතුළත් කරනු ලැබ ඇති යම් උභය ජීවියකු හෝ මත්ස්‍යයකු දැන දැනම මරණ, තුවාල සිදු කරන, එවැනි සතකුට හානි සිදු කරන, එවැනි සතකු අල්ලා ගන්නා හෝ එකතු කරන ; හෝ

(ආ) එවැනි යම් උභය ජීවියකුගේ හෝ මත්ස්‍යයකුගේ බිත්තර, මාළු බිත්තර හෝ කූඩු ගන්නා හෝ විනාශ කරන ; හෝ

(ඇ) එවැනි යම් උභය ජීවියකු හෝ මත්ස්‍යයකු මැරීමේ හෝ එවැනි උභය ජීවියකුට හෝ මත්ස්‍යයකුට තුවාල සිදු කිරීමේ හෝ හානි කිරීමේ හෝ එම උභය ජීවියා හෝ මත්ස්‍යයා අල්ලා ගැනීමේ කාර්යය සඳහා යම් බෝට්ටුවක් හෝ යම් ලාවු වර්ගයක් හෝ මල පුඩුවක්, දැලක්, උල් කටුවක්, උගුලක්, තුවක්කුවක්, පොල්ලක්, ලනුවක් හෝ යම් උපකරණ සහිත කොක්කක් හෝ ඇමක් හෝ යම් ආකාරයක පුපුරන ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් උපකරණයක් පාවිච්චි කරන ; හෝ

(ඈ) මරණ ලද හෝ අල්ලා ගන්නා ලද එවැනි යම් උභය ජීවියකු හෝ මත්ස්‍යයකු හෝ එවැනි උභය ජීවියකුගේ හෝ මත්ස්‍යයකුගේ යම් කොටසක් හෝ තම සන්තකයෙහි හෝ තම පාලනය යටතේ තබා ගෙන සිටින ; හෝ

(ඉ) එවැනි යම් උභය ජීවියකු හෝ මත්ස්‍යයකු හෝ එවැනි උභය ජීවියකුගේ හෝ මත්ස්‍යයකුගේ යම් කොටසක් ප්‍රවාහනය කරන හෝ විකිණීම සඳහා ඉදිරිපත් කරන හෝ ප්‍රදර්ශනය කරන ; හෝ

(ඊ) වෙළීමේ, කල්තබා ගැනීම සඳහා සකස් කිරීමේ හෝ වෙනත් යම් කාර්යයක් සඳහා එවැනි උභය ජීවියකු හෝ මත්ස්‍යයකු මිලදී ගන්නා

යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් විසි දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

IVඅ වන උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ කොඳු ඇට පෙළ රහිත සතුන් සම්බන්ධයෙන් වන වැරදි.

31ආ. ජාතික රක්ෂිත භූමියකින් හෝ අභය භූමි යකින් පිටත යම් ප්‍රදේශයක් තුළ—

(අ) IVඅ උපලේඛනයෙහි තත්කාලයෙහි ඇතුළත් කරනු ලැබ ඇති, කොඳු ඇට පෙළ රහිත යම් සතකු දැන දැනම මරණ, තුවාල කරන, හානි සිදු කරන, අල්ලා ගන්නා හෝ එකතු කරන ; හෝ

(ආ) එවැනි කොඳු ඇට පෙළ රහිත සතකුගේ බිත්තර, බිජ, පිළවු හෝ කූඩු ලබා ගන්නා හෝ විනාශ කරන ; හෝ

(ඇ) එවැනි කොඳු ඇට පෙළ රහිත යම් සතකු මැරීමේ හෝ තුවාල සිදු කිරීමේ හෝ හානි සිදු කිරීමේ හෝ එවැනි සතකු අල්ලා ගැනීමේ හෝ එකතු කිරීමේ කාර්යය සඳහා යම් බෝට්ටුවක්, ලාටු වර්ගයක්, මල පුඩුවක්, දැලක්, උල් කටුවක්, උගු ලක්, තුවක්කුවක්, පොල්ලක් හෝ යම් උපකරණයක් සහිත බිලී පිත්තක් හෝ කොක්කක් හෝ ඇමක් හෝ යම් ආකාරයක පුපුරන ද්‍රව්‍යයක් හෝ වෙනත් යම් උපකරණයක් පාවිච්චි කරන ; හෝ

(ඈ) මරණ ලද හෝ අල්ලා ගන්නා ලද කොඳු ඇට පෙළ රහිත එවැනි යම් සතකු හෝ එවැනි සතකුගේ යම් කොටසක්, බිත්තර, බිජ හෝ පිළවු තම සන්තකයෙහි හෝ තම පාලනය යටතේ තබා ගෙන සිටින ; හෝ

(ඉ) කොඳු ඇට පෙළ රහිත එවැනි යම් සතකු හෝ එම සතාගේ කොටසක් විකිණීම සඳහා ප්‍රදර්ශනය කරන හෝ ඉදිරිපත් කරන හෝ ප්‍රවාහනය කරන ; හෝ

(ඊ) වේලීමේ, කල්තබා ගැනීම සඳහා සකස් කිරීමේ හෝ වෙනත් යම් කාර්යයක් සඳහා කොඳු ඇට පෙළ රහිත එවැනි යම් සතකු මිළදී ගන්නා

යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, එසේ වරදකරු කිරීමේ දී රුපියල් දස දහසකට අඩු නොවන සහ රුපියල් විසි දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ඉවත් කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන් උභය ජීවීන්, මත්ස්‍යයන්, කොඳු ඇට පෙළ රහිත සතුන් වර්ග ඔප්පු කිරීම.

35. (1) පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා යම් නිසි බලධරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු හෝ කොඳු ඇට පෙළ රහිත සතකු නැතහොත් ක්ෂීරපායී සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, උභය ජීවියකුගේ, මත්ස්‍යකුගේ හෝ කොඳු ඇට පෙළ රහිත සතකුගේ, යම් කොටසක් අවස්ථාවෝචිත පරිදි I වන උපලේඛනයෙහි, II වන උපලේඛනයෙහි, III වන උපලේඛනයෙහි. IV වන හෝ IVඅ උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ සිටින ක්ෂීරපායී සතකු හෝ කොඳු ඇට පෙළ රහිත සතකු බවට නැතහොත් ක්ෂීරපායී සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, උභය ජීවියකුගේ, මත්ස්‍යයකුගේ හෝ කොඳු ඇටපෙළ රහිත සතකුගේ කොටසක් බවට එම බලධරයා විසින් අත්සන් කරනු ලැබූ ලෙස සැලකෙන සහතිකයක් කවර හෝ අධිකරණයක දී ඉදිරිපත් කරනු ලැබූ විට පටහැනිව ඔප්පු කරනු ලබන තෙක් එය එකී සහතිකයෙහි දැක්වෙන කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂියක් වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා "නිසි බලධරයා" යන යෙදුමෙන්—

(අ) ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂවරයා ;

(ආ) ජාතික සත්ව උද්‍යානයේ අධ්‍යක්ෂවරයා අදහස් වේ.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තියේ ඇති "නොකළ යුතු යයි ප්‍රකාශ කළ හැකි ය." යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 36 වන වගන්තිය සංශෝධනය කිරීම.

"හෝ එවැනි යම් පක්ෂියකුගේ බිත්තර හෝ කූඩුව ගැනීම නොකළ යුතු යයි ප්‍රකාශ කළ හැකි ය. තවද එවැනි යම් ප්‍රදේශයක් තුළ හා එකී නිශ්චිතව සඳහන් කාලසීමාව තුළදී පක්ෂියකු වෙඩි තබන, මරණ, අල්ලා ගන්නා හෝ එවැනි යම් පක්ෂියකුගේ බිත්තර හෝ කූඩු ලබාගන්නා යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමේ දී රුපියල් පන් දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

39. ප්‍රධාන ප්‍රඥප්තියේ 37, 38, 30, 40, 41 සහ 42 වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 37, 38, 39, 40, 41 සහ 42 වන වගන්ති ප්‍රතියෝජනය කිරීම.

"අවසරපත්‍ර නොමැතිව ක්ෂිරපායි සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන් සහ කොඳු ඇට පෙළ රහිත සතුන් ආනයනය තහනම් කිරීම.

37. (1) නියමිත ගාස්තුව ගෙවීම මත නියමිත නිලධරයාගෙන් ලබාගත් නියමිත අවසර පත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින් මියගිය හෝ ජීවත්ව සිටින යම් ක්ෂිරපායි සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු, හෝ කොඳු ඇට පෙළ රහිත සතකු හෝ එවැනි යම් ක්ෂිරපායි සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, උභය ජීවියකුගේ, මත්ස්‍යයකුගේ හෝ කොඳු ඇට පෙළ රහිත සතකුගේ යම් කොටසක් හෝ එම සතුන්ගේ බිත්තර, බිජ හෝ පිළවු ශ්‍රී ලංකාවට ආනයනය කිරීම නොකළ යුතු ය.

(2) මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් මෙන් බලපැවැත්විය යුතු අතර, ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ වන්නේ ය.

(3) මේ වගන්තියේ විධිවිධාන 11 වන වගන්තියෙහි අර්ථ නිරූපණය කරනු ලැබ ඇති ගෘහාශ්‍රිත සතුන් හෝ උෂ්ණ කලාපීය කුඩා ජලාශ මත්ස්‍යයන් සම්බන්ධයෙන් අදාළ නොවේ.

"උෂ්ණ කලාපීය කුඩා ජලාශ මත්ස්‍යයන්" යන්නෙන් IV වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන මිරිදිය මත්ස්‍යයන් අතුරින් යම් මත්ස්‍ය වර්ගයක් අදහස් වේ.

(4) සැකයක් හෝ මතභේදයක් ඇති වූ අවස්ථා වක දී යම් මත්ස්‍යයකු උෂ්ණ කලාපීය කුඩා ජලාශ මත්ස්‍ය වර්ගයකට අයත් බවට හෝ යම් මත්ස්‍ය වර්ගයක් උෂ්ණ කලාපීය කුඩා ජලාශ මත්ස්‍ය වර්ගයකට අයත් බවට හෝ අධ්‍යක්ෂවරයා විසින් අත්සන් කරනු ලැබූ ලෙස සැලකෙන සහතිකයක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

ක්ෂීරපායී සතුන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන් සහ කොඳු ඇට පෙළ රහිත සතුන් සම්බන්ධයෙන් වන නියෝග.

38. (අ) 37 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු හෝ කොඳු ඇට පෙළ රහිත සත්වයකු ආනයනය කරන තැනැත්තකුට එකී ක්ෂීරපායී සතා, පක්ෂියා, උරගයා, උභය ජීවියා, මත්ස්‍යයා හෝ කොඳු ඇට පෙළ රහිත සතා රෝගයකින් හෝ ආසාදනයකින් තොර බවට අනුමත බලධරයකුගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කරන ලෙස නියම කරන්නා වූ; හෝ

(ආ) 37 වන වගන්තිය යටතේ නිකුත් කරන අවසර පත්‍රයක් මත ආනයනය කරනු ලැබූ ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු, හෝ කොඳු ඇට පෙළ රහිත සතකු ශ්‍රී ලංකාවේ යම් කොටසක් තුළ නිදහස් කර හැරීම හෝ මුදා හැරීම තහනම් කරමින් හෝ එම ක්ෂීරපායී සතා, පක්ෂියා, උරගයා, උභය ජීවියා, මත්ස්‍යයා හෝ කොඳු ඇට පෙළ රහිත සතා නිදහස් කරනු ලැබිය හැකි හෝ මුදා හරිනු ලැබිය හැකි ප්‍රදේශය හෝ ප්‍රදේශ නියම කරන්නා වූ; හෝ

නියෝග සාදනු ලැබිය හැකි ය.

ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන්, හෝ කොඳු ඇට පෙළ රහිත සතුන් නීති විරෝධී ලෙස ආනයනය කිරීම හෝ මුදා හැරීම සම්බන්ධයෙන් දණ්ඩනය.

39. (1) (අ) 37 වන වගන්තියේ විධිවිධාන හෝ 38 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයක විධිවිධාන කඩ කරමින් යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු හෝ කොඳු ඇට පෙළ රහිත සතකු ශ්‍රී ලංකාවට ආනයනය කරන ; හෝ

(ආ) 38 වන වගන්තිය යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමේ දී රුපියල් පන්දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) 37 වන වගන්තියේ විධිවිධාන කඩකරමින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු මත්ස්‍යයකු හෝ කොඳු ඇට පෙළ රහිත සතකු නිදහස් කර හරින හෝ මුදා හරින යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමේ දී (1) වන උපවගන්තිය යටතේ ඔහු යටත් කරනු ලැබිය හැකි යම් දඩුවමකට අමතරව එසේ නිදහස් කර හරින හෝ මුදාහරින ලද එක් එක් ක්ෂීරපායී සතා, පක්ෂියා, උරගයා, උභය ජීවියා, මත්ස්‍යයා හෝ කොඳු ඇට පෙළ රහිත සතා වෙනුවෙන් රුපියල් දෙදහසක දඩයකට ද යටත් වන්නේ ය.

අවසර පත්‍රයක් නොමැතිව ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන්, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සතුන් අපනයනය කිරීම.

40. (1) නියමිත ආකෘති පත්‍රයෙහි වන්නා වූ ද නියමිත ගාස්තුව ගෙවීමෙන් නියමිත නිලධරයාගෙන් ලබාගත් අවසර පත්‍රයක් නොමැතිව කිසිම තැනැත්තකු විසින්—

(අ) මියගිය හෝ ජීවත්වන ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සතකු ; හෝ

(ආ) යම් පක්ෂියකුගේ බිත්තර, පිහාටු හෝ පිල් කලඹ හෝ යම් ක්ෂීරපායී සතකුගේ අං, අං තට්ටුව හෝ හම හෝ යම් සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, උභය ජීවියකුගේ, මත්ස්‍යයකුගේ, හිරිගලක හෝ කොඳු ඇට පෙළ රහිත සතකුගේ යම් කොටසක්

අපනයනය නොකළ යුතු ය.

(2) විදේශීය කෞතුකාගාරවලට හා විදේශීය සත්වෝද්‍යානවලට කරන සැපයීම් හෝ දේශීය කෞතුකාගාරවලට හෝ දේශීය සත්වෝද්‍යානවලට කරනු ලබන සැපයීම්වලට හුවමාරු වශයෙන් කරන සැපයීම් ඇතුළුව විද්‍යාත්මක දැනුම වර්ධනය කිරීම සඳහා හෝ නියම කරනු ලබන වෙනත් කාර්යයන් සඳහා හැර එවැනි අවසර පත්‍ර නිකුත් කරනු නොලැබිය යුතු ය.

(3; මේ වගන්තිය රේගු ආඥාපනතේ කොටසක් වූවාක් මෙන් බලපැවැත්විය යුතු අතර ඒ ආඥාපනතේ විධිවිධාන ඒ අනුව අදාළ වන්නේ ය.

(4) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන—

(අ) 11 වන වගන්තියෙහි අර්ථ නිරූපනය කරනු ලැබූ යම් ගෘහාශ්‍රිත සතකු සම්බන්ධයෙන් ; හෝ

(ආ) ශ්‍රී ලංකාවට දේශීය නොවන වර්ගයකට අයත් යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සතකු සම්බන්ධයෙන් හෝ

අදාළ නොවිය යුතු ය.

(5) සැකයක් හෝ මතභේදයක් ඇති වූ අවස්ථාවක දී ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, මත්ස්‍යයකු, උභය ජීවියකු, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සතකු, ශ්‍රී ලංකාවට දේශීය නොවන වර්ගයක් බවට හෝ ක්ෂීරපායී සත්ව, පක්ෂී, උරග, මත්ස්‍ය, උභය ජීවී, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සත්ව වර්ගයක් ශ්‍රී ලංකාවට දේශීය නොවන වර්ගයක් බවට හෝ යම් ක්ෂීරපායී සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, මත්ස්‍යයකුගේ, උභය ජීවියකුගේ, හිරිගලක හෝ කොඳු ඇට පෙළ රහිත සතකුගේ යම් කොටසක් ශ්‍රී ලංකාවට දේශීය නොවන යම් ක්ෂීරපායී, පක්ෂී, උරග, මත්ස්‍ය, උභය ජීවී, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සත්ව වර්ගයක කොටසක් බවට හෝ යම් උරගයකුගේ හෝ පක්ෂියකුගේ බිත්තරයක් ශ්‍රී ලංකාවට දේශීය නොවන උරග හෝ පක්ෂී වර්ගයක බිත්තරයක් බවට ජාතික කෞතුකාගාර අධ්‍යක්ෂ හෝ සත්වෝද්‍යාන අධ්‍යක්ෂවරයා හෝ ජාතික ජලජ සම්පත් ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් අත්සන් කරනු ලැබූ ලෙස සැලකෙන සහතිකයක් සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලු බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(6) (අ) මේ වගන්තියේ සඳහන් කරනු ලැබ ඇති යම් විෂයාංගයක් අපනයනය කිරීමට පෙර එය පරීක්ෂා කිරීමට බලය ඇති නිලධරයා නියම කරමින් ද;

(ආ) එසේ පරීක්ෂා කිරීමට පසුව එවැනි යම් විෂයාංගයක් මුද්‍රා තැබීමට බලය ඇති නිලධරයා නියම කරමින් ද;

(ඇ) එවැනි යම් විෂයාංගයක් අපනයනය කරන්නකු විසින් එම විෂයාංගයෙහි සන්තකය ලබා ගත්තේ යම් අවස්ථානුගත කරුණු යටතේ ද එම අවස්ථානුගත කරුණු ඔප්පු කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන නියම කරමින් ද

නියෝග සාදනු ලැබිය හැකි ය.

ක්ෂීරපායී සතුන්, පක්ෂීන්, උරගයන්, උභය ජීවීන්, මත්ස්‍යයන්, සහ කොඳු ඇට පෙළ රහිත සතුන් අපනයනය කිරීම සම්බන්ධයෙන් දණ්ඩන.

**41.** 40 වන වගන්තියේ විධිවිධාන කඩ කරමින් මියගිය හෝ ජීවත්ව සිටින යම් ක්ෂීරපායී සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු හෝ කොඳු ඇට පෙළ රහිත සතකු හෝ යම් ක්ෂීර පායී සතකුගේ, පක්ෂියකුගේ, උරගයකුගේ, උභය ජීවියකුගේ, මත්ස්‍යයකුගේ හෝ කොඳු ඇට පෙළ රහිත සතකුගේ යම් කොටසක් හෝ බිත්තර, පිහාටු, පිල් කළඹ, අං, අං තට්ටු හෝ හම ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය කරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමේ දී රුපියල් විසි දහසකට අඩු නොවන සහ රුපියල් පනස් දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

V වන උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබූ පැලෑටි ආරක්ෂා කිරීම.

**42.** කිසිම තැනැත්තකු විසින් යම් ප්‍රදේශයක දී—

(අ) තත් කාලයෙහි දී V වන උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබුවා වූද—

(i) වෙනත් යම් තැනැත්තකුට අයත් දේපළක වැඩෙන්නා වූ ද; නැතහොත්

(ii) යම් පොදු ස්ථානයක වැඩෙන්නා වූ ද

යම් පැලෑටියක් ඉවත් කිරීම, ඉදිරීම හෝ විනාශ කිරීම ; හෝ

(ආ) තත් කාලයෙහි V වන උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ ඇත්තා වූ ද තමාට අයත් ස්ථානයක වැඩෙන්නා වූ ද යම් පැලෑටියක් විනාශ කිරීම ; හෝ

(ඇ) තත් කාලයෙහි V වන උපලේඛනයෙහි ඇතුළත් කරනු ලැබ ඇති යම් පැලෑටියක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම ; හෝ

(ඇ) යම් උඩවැඩියා පැලෑටියක් හෝ වෙනත් යම් අපරිජීවි පැලෑටියක් වැඩෙන යම් ගසක් ඉවත් කිරීම හෝ ඉද්දීම හෝ විනාශ කිරීම හෝ එවැනි ගසකට හානියක් හෝ අනතුරක් කිරීම; හෝ

නොකළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (ඇ) ඡේදය ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

IV වන කොටස යටතේ වන වැරදි.

40. (අ) 42 වන වගන්තියේ විධිවිධාන; හෝ
(ආ) 43 වන වගන්තියේ විධිවිධාන; හෝ
(ඇ) 45 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග කඩ කරමින් ක්‍රියාකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමේදී රුපියල් තුන් දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"IV වන කොටසේ අර්ථ නිරූපනය

48. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ ආඥාපනතේ IV වන කොටසෙහි—

"ශාකයක්" යන්නෙන් ශාක ලෝකයේ සාමාජිකයකු අදහස් වේ.

"පොදු ස්ථානය" යන්නෙන් රජයේ ඉඩමක් හෝ රජය විසින් සුදුස්සක් කිරීමට ඉඩ ඇති ඉඩමක් හෝ පළාත් පාලන ආයතනයකට හෝ පොදු සංස්ථාවකට අයත් හෝ පළාත් පාලන ආයතනයක් හෝ පොදු සංස්ථාවක් සතු කරනු ලැබූ ඉඩමක් අදහස් වන අතර එයට පෞද්ගලික දේපළ නොවන සියලු ඉඩම් ඇතුළත් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු නියමිත නිලධරයාගෙන් ලබාගත් නියමිත ආකෘති පත්‍රයෙහි එක් එක් ව්‍යාපාරය හෝ වෙළෙඳාම සම්බන්ධයෙන් ලබාගත් බලපත්‍රයක් ඇතිව මිස, කිසිම තැනැත්තකු විසින් චර්ම පරිකර්ම ශිල්පියකුගේ, හම් පදම් කරන්නකුගේ, හම් වෙළෙන්දකුගේ හෝ ජය මූර්ති වෙළෙන්දකුගේ ව්‍යාපාරය හෝ වෙළඳාම හෝ මැරුණු හෝ පණ ඇති යම් සතකු හෝ මැරුණු යම් සතකුගේ යම් කොටස් හෝ මිළට ගැනීම, විකිණීම හෝ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් වන යම් ව්‍යාපාරයක් හෝ වෙළඳාමක් කරගෙන යාම හෝ ක්‍රියාත්මක කිරීම නොකළ යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 49අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

" පුද්ගලයන්ගේ සන්තකයෙහි ඇති සතුන් ලියාපදිංචි කිරීම.

**49අ. (1)** නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු අධ්‍යක්ෂවරයා විසින් නියමිත ආකෘති පත්‍රයක් අනුව නිකුත් කරනු ලබන අවසර පත්‍රයක අධිකාරය යටතේ සහ එම අවසර පත්‍රයේ ඇති කොන්දේසිවලට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින්, මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයෙන් පසුව, නියමිත සංඛ්‍යාවට වඩා යම් සතුන් ප්‍රමාණයක් තම සන්තකයෙහි හෝ භාරයෙහි හෝ තම පාලනය යටතේ තබා ගැනීම නොකළ යුතු ය :

එසේ වුව ද මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයට පෙර නියමිත සංඛ්‍යාවට වැඩියෙන් යම් සතකු යම් තැනැත්තකුගේ සන්තකයෙහි හෝ භාරයේ හෝ එම තැනැත්තාගේ පාලනය යටතේ ඇති අවස්ථාවක දී, මේ වගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයෙන් මාස තුනක කාලයක් ඇතුළත දී එම තැනැත්තා විසින් (1) වන උප වගන්තිය යටතේ වූ අවසර පත්‍රයක් ලබා ගත යුතු ය.

(2) අධ්‍යක්ෂවරයාට හෝ නියමිත නිලධරයකුට—

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක අධිකාරය යටතේ යම් සතකු තබා ඇති යම් පරිශ්‍රයකට ඇතුළුවීමට, පරීක්ෂා කිරීමට සහ සෝදිසි

කිරීමට ද අවසර පත්‍රයේ කොන්දේසිවලට එකඟව ක්‍රියාකර ඇද්ද යන්න පිළිබඳව තමන් සෑහීමට පත්වීමට ද ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයේ විධිවිධාන කඩ කරමින් එම පරිශ්‍රයේ තබා ඇති යම් සතකු තගනමට ගැනීමට ද

බලය තිබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා විසින් අවශ්‍ය යයි සලකන පරීක්ෂණ පැවැත්වීමෙන් පසු (2) වන උපවගන්තිය යටතේ තගනමට ගනු ලැබූ යම් සතකු රාජ්‍ය සන්තක කිරීමට ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ය. අධ්‍යක්ෂවරයාගේ නියමයෙන් අතෘප්ති යට පත් යම් තැනැත්තකු විසින් රාජ්‍ය සන්තක කිරීමෙන් දින දාහතරක් ඇතුළත තමා එම රාජ්‍ය සන්තක කිරීමට එරෙහිව උචිත අධිකරණයෙහි නඩු පැවරීමට අදහස් කරන බවට අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව දැනුම් දිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ රාජ්‍ය සන්තක කිරීමේ නියමයක්, එම නියමයේ දින සිට දින දාහතරක් ගතවන තුරු හෝ එම නියමය සම්බන්ධයෙන් නඩුවක් පවරනු ලැබ ඇති අවස්ථාවක දී, අධිකරණය විසින් එම නඩුව සම්බන්ධයෙන් අවසාන වශයෙන් නිශ්චය කිරීමක් කරන තුරු හෝ, බලාත්මක නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය සංශෝධනය කිරීම

**45.** ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ඇති "වරදක් කරන අතර" යන වචනවල සිට එම වගන්තියේ අවසානය දක්වා ඇති වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"වරදකට වරදකරු වන අතර එසේ වරදකරු වීමෙදී රුපියල් පන් දහසකට අඩු නොවන සහ රුපියල් දස දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

**46.** ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ ඇති "පක්ෂියකු හෝ සතෙකු" යන වචන වෙනුවට "සතෙකු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

52 වන, 52අ වන, 53 වන, 53අ වන සහ 53ආ වන වගන්ති ප්‍රතිස්ථාපනය කිරීම.

**47.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52, 52අ, 53, 53අ සහ 53ආ වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති ආදේශ කරනු ලැබේ :—

" කෘත්‍රිම ආලෝක පාවිච්චිය තහනම් කිරීම.

52. යම් සතෙකුගේ පෙනීම මුලා කිරීමෙන් හෝ යම් කෘත්‍රිම ආලෝකයකින් එම සතා ඇද ගැනීමෙන් හෝ අන්ධකාරයකින් එම සතා විනාශ කිරීමට හෝ අල්ලා ගැනීමට හැකිවීමේ හෝ පහසු වීමේ කාර්ය සඳහා කිසිම තැනැත්තකු විසින් එවැනි කෘත්‍රිම ආලෝකයක් පාවිච්චි නොකළ යුතු ය. මත්ස්‍ය කර්මාන්තයකින් ආලෝකය යොදා මසුන් තෙලීමට අවසර පත් ලබා ඇති අයට මෙය අදාළ නොවේ.

ජලාශවලට අසලදී වෙඩි තැබීම් ආදිය තහනම් කිරීම.

52අ. සතුන් සිරිත් පරිදි දිය බීමට යන දිය කඩිත්තක හෝ ස්ථානයක සිට යාර සියයක දුර ප්‍රමාණයක් ඇතුළත දී කිසිම තැනැත්තකු විසින් සතෙකුට වෙඩි තැබීම, තුවාල කිරීම හෝ එම සතා මැරීම නොකළ යුතු ය.

ජාතික රක්ෂිත භූමිවලින් පිටත රජයේ ඉඩම් තුළ හෝ ප්‍රසිද්ධ මංමාවත් තුළ දඩයම් කිරීම, වෙඩි තැබීම ආදිය තහනම් කිරීම.

53. නියෝගවලට අනුකූලව මිස, කිසිම තැනැත්තකු විසින් ජාතික රක්ෂිත භූමියකින් පිටත භූ රජයේ ඉඩමක හෝ ප්‍රසිද්ධ මංමාවතක දී—

(අ) හිරු බැසීම හා හිරු නැඟීම අතර කිසිම තැනැත්තකු විසින් යම් සතකු දඩයම් කිරීම, වෙඩි තැබීම, මැරීම හෝ ගැනීම;

(ආ) යම් සතකු මැරීමේ හෝ අල්ලා ගැනීමේ කාර්ය සඳහා යම් දැලක්, බොරු වලක්, උගුලක්, මළ පුඩුවක් හෝ වෙනත් උප කරණයක් එලීම, ඇටවීම හෝ තැබීම; හෝ

(ඇ) යම් සතකුට වෙඩි තැබීම හෝ තුවාල කිරීමේ කාර්ය සඳහා පොළොව මතුපිට හෝ ගසක් මත පොරොත්තු ස්ථාන යක් හෝ සැඟවුම් පොලක් ඉදිකිරීම හෝ පාවිච්චි කිරීම නොකළ යුතු ය.

සතුන් සඳහා විස යොදීම තහනම් කිරීම.

53අ. යම් සතෙකුට වස කැවීමේ නැතහොත් යම් සතෙකු මැරීමේ හෝ මත් කිරීමේ කාර්ය සඳහා කිසිම තැනැත්තකු විසින් යම් වසක්, පුපුරන ද්‍රව්‍යයක් හෝ මත කිරීමේ ද්‍රව්‍යයක් පාවිච්චි නොකළ යුතු ය.

වස ආදිය පාවිච්චි කිරීමෙන් මරන ලද හෝ ගන්නා ලද යම් සතෙකුගේ මස් සන්තකයේ තබා ගැනීම ආදිය තහනම් කිරීම.

53ආ. යම් වසක්, පුපුරන ද්‍රව්‍යයක් හෝ මත් කිරීමේ ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් මරනු ලැබූ හෝ අල්ලා ගනු ලැබූ සතකුගේ මස් කිසිම තැනැත්තකු විසින් සන්තකයෙහි තබා ගැනීම, විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහනය කිරීම නොකළ යුතු ය :

එසේ වුව ද තම සන්තකයෙහි තබා ගැනීම විකිණීම, විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රවාහ

නය කිරීම සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබුවේ යම් සතෙකුගේ මස් සම්බන්ධයෙන් ද ඒ සතා මරනු ලැබුවේ හෝ අල්ලා ගනු ලැබුවේ යම් වසක්, පුපුරන ද්‍රව්‍යයක් හෝ මත් කිරීමේ ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් යයි තමා දැන නොසිටි බව සහ එසේ විශ්වාස කිරීමට සාධාරණ හේතු තමාට නොතිබුන බව යම් තැනැත්තකු ඔප්පු කළහොත් ඒ තැනැත්තා මේ වගන්තිය යටතේ වරදකරු කරනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 53ඇ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**48.** ප්‍රධාන ප්‍රඥප්තියේ 53ආ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්තිය, ප්‍රධාන ප්‍රඥප්තියේ 53ඇ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:—

"යම් සතෙකුගේ මාංශ හඳුනා ගැනීම අවශ්‍ය වූ විටෙක ඔප්පු කිරීම.

53ඇ. (1) 53අ වගන්තිය යටතේ වූ වරදක් සඳහා වන නඩු පැවරීමක දී යම් මසක්, වස දීමෙන්, පුපුරන ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීමෙන් හෝ මත් කිරීමේ ද්‍රව්‍යයක් දීමෙන් අල්ලා ගන්නා ලද හෝ මරණ ලද සතෙකුගේ මස් වන්නේ ද යන්න සම්බන්ධයෙන් සැකයක් හෝ මතභේදයක් ඇති වන අවස්ථාවක දී අදාළ මස් වර්ගය යම් වසක්, පුපුරන ද්‍රව්‍යයක් හෝ මත් කිරීමේ ද්‍රව්‍යයක් පාවිච්චි කිරීමෙන් මරණ ලද හෝ අල්ලා ගන්නා ලද සතෙකුගේ මස් බවට නිසි බලධාරියා විසින් අත්සන් කරනු ලැබූ ලෙස සැලකෙන සහතිකයක් යම් අධිකරණයක දී ඉදිරිපත් කිරීමේ දී, පටහැනිව ඔප්පු කරනු ලබන තෙක් එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු ය.

(2) මේ වගන්තියෙහි "නිසි බලධරයා" යන්නෙන්—

(අ) රජයේ වෛද්‍ය නිලධරයකු; හෝ

(ආ) රජයේ පශු වෛද්‍යවරයකු

අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**49.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මැරීම තහනම් කරන ලද සතුන්ගේ මස් ආහාර වශයෙන් පිළිගැන්වීම තහනම් කිරීම.

54. තත්කාලයෙහි මේ ආඥාපනත යටතේ මැරීම තහනම් කරනු ලැබ ඇති යම් සතෙකුගේ මසින් සමන්විත වූ හෝ මස් අඩංගු යම් ආහාරයක් යම් ආපන ශාලාවක දී, භෝජනාගාරයක දී, තානායමක දී හෝ සැමහලකදී ආහාර වශයෙන් පිළිගැන්වීම හෝ පිළිගැන්වීමට බලය පැවරීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, වරද කරු කරනු ලැබීමෙන් පසු රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් විසි දහසකට නොවැඩි දඩය කට හෝ අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු පහ කට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය. ".

**50.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියේ (1) වන උපවගන්තියේ ඇති " ලංකාවේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා හෝ විද්‍යාත්මක අධ්‍යයනය හෝ විමර්ෂණය කිරීම සඳහා හෝ සත්වෝද්‍යානයක්, කෞතුකාගාරයක් හෝ ඒ හා සමාන ආයතනයක් සඳහා " යන වචන වෙනුවට " ශ්‍රී ලංකාවේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම හෝ ව්‍යාප්ත කිරීම සඳහා හෝ විද්‍යාත්මක අධ්‍යයනය හෝ විමර්ෂණය කිරීම සඳහා හෝ ජාතික සත්වෝද්‍යානයක්, ජාතික කෞතුකාගාරයක් හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවනු ලැබූ ලෙස සැලකෙන යම් විශ්ව විද්‍යාලයක් සඳහා " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම.

**51.** ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම ප්‍රඥප්තියේ 55අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 55අ වගන්තිය ඇතුළත් කිරීම.

" V වන කොටසේ අර්ථ නිරූපණය.

55අ. මේ ආඥාපනතේ මේ කොටසෙහි—

" සතා " යන්නෙන් යම් ක්ෂීරපායි සතකු, පක්ෂියකු, උරගයකු, උභය ජීවියකු, මත්ස්‍යයකු, හිරිගල් හෝ කොඳු ඇට පෙළ රහිත සතකු අදහස් වන අතර 11 වන වගන්තිය මගින් අර්ථ නිරූපනය කරනු ලැබ ඇති ගෘහාශ්‍රිත සතකු හෝ 37 වන වගන්තිය මගින් අර්ථ නිරූපණය කරනු ලැබ ඇති යම් උෂ්ණ කලාපීය කුඩා ජලාශ මත්ස්‍යයකු හෝ එයින් අදහස් නොවේ.".

**52.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද නියෝගයක් යටතේ තමා වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් වෙත යම් තැනැත්තකුට අවරත යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කිරීමේ දී රුපියල් දහසකට අඩු නොවන සහ

රුපියල් දෙදහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු එකකට අඩු නොවන හා අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 58 සහ 58අ වගන්ති ප්‍රතියෝජනය කිරීම.

53. ප්‍රධාන ප්‍රඥප්තියේ 58 සහ 58අ වන වගන්ති මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්ති මෙයින් ආදේශ කරනු ලැබේ:—

"සාමාන්‍ය දණ්ඩන.

58. මේ ආඥාපනතේ හෝ යම් නියෝගයක විධිවිධාන හෝ මේ ආඥාපනත යටතේ හෝ යම් නියෝගයක් යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක හෝ අවසර පත්‍රයක ඇතුළත් යම් කොන්දේසියක් කඩ කරමින් ක්‍රියා කරන යම් තැනැත්තකු මේ ආඥාපනත මගින් ප්‍රකාශිතවම වෙනත් දණ්ඩනයක් සඳහා විධිවිධාන සලස්වනු නොලැබූ අවස්ථාවක දී, රුපියල් දෙදහසකට අඩු නොවන සහ රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකට හෝ අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු වරදක් කරන්නේ ය.

ඇතුන් සම්බන්ධයෙන් කරනු ලබන වැරදි සඳහා විශේෂ දණ්ඩන.

